**අංක 10/25/08/2022 දරණ මාරුකිරීම් චක්‍රලේඛය.**

**අධීක්ෂණ කළමනාකරණ සහකාර - තාක්ෂණික නොවන / තාක්ෂණික නිළධර ගණයේ තැපැල් සේවා නිලධාරි I ,II , හා III ශ්‍රේණිවල සියළුම නිලධාරින් වෙතයි.**

**වාර්ෂික ස්ථාන මාරු කිරීම් - 2021/2022**

01. **2021.12.31** දිනට පහත දැක්වෙන පුරප්පාඩු ඇති වෙතැයි **අපේක්ෂා කෙරේ.** එම පුරප්පාඩු සඳහා 1995 සැප්තැම්බර් මස 01 වැනි දින අංක II දරණ "ශ්‍රී ලංකා තැපැල් කාර්යාල චක්‍රලේඛයේ" අංක 01 දරණ අතිරේකයේ අංක 03 දරණ මාරු කිරීමේ පරිපාටිය අනුව ස්ථාන මාරු ඉල්ලුම් කිරීමට සුදුසුකම් ලබා ඇති අධීක්ෂණ කළමනාකරණ සහකාර - තාක්ෂණික නොවන / තාක්ෂණික නිළධර ගණයේ තැපැල් සේවා නිලධාරි 1, 11 ,හා 111 ශ්‍රේණිවල සියළුම නිළධාරීන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

02. අධීක්ෂණ කළමනාකරණ සහකාර - තාක්ෂණික නොවන / තාක්ෂණික නිළධර ගණයේ තැපැල් සේවා නිලධාරි 1 ශ්‍රේණියේ නිළධාරින්ගේ ස්ථාන මාරු රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අනුමැතිය පරිදි පත් කරනු ලබන මාරු කිරීමේ මණ්ඩලයක නිර්දේශ මත සිදු කරනු ලැබේ. දැනට පළමු පෙළ රාජකාරීයේ නිරත වන නිළධාරින් සහ උසස් වීම් ලද එහෙත් සේවයේ අවශ්‍යතාවය මත රඳවාගෙන ඇති නිලධාරීන් ( විශේෂ හේතූන් නිසා සේවයේ අවශ්‍යතාවය මත රඳවා ගැනිමට වීධීමත් ලෙස තැපැල්පති අනුමැතිය ලබාගෙන ඇති 11 පෙළ නිළධාරීන් පමණක් )1 පෙල පුරප්පාඩු සඳහා ඉල්ලුම් කල යුතුය.

03. අධීක්ෂණ කළමනාකරණ සහකාර - තාක්ෂණික නොවන / තාක්ෂණික නිළධර ගණයේ තැපැල් සේවා නිලධාරි 11 ,හා 111 ශ්‍රේණියේ නිළධාරින්ගේ ස්ථාන මාරු 1995 සැප්තැම්බර් මස 01 වැනි දින අංක 11 දරණ "ශ්‍රී ලංකා තැපැල් කාර්යාල චක්‍රලේඛයේ" අංක 01 දරණ අතිරේකයේ අංක 2:1 අනුව ක්‍රියාත්මක කරනු ලැබේ.

04. **2018.07.01** වන දින හෝ ඊට පෙර දැනට සිටින සේවා ස්ථානයට වාර්තා කරන ලද නිළධාරීන්ගේ පුරප්පාඩු ද, **2021.12.31** දින දක්වා ලබා දී ඇති පාලන, තාවකාලික සහ සේවා දීර්ඝ කිරීම්ද , මෙම පුරප්පාඩු වලට ඇතුළත්ය.

05. එසේම පසුගිය වසරේ වාර්ෂික ස්ථානමාරු ලබාදෙන අවස්ථාවේ වයස් පදනම මත සේවා දිගු ලබා ගත් මේ වන තුරු විශ්‍රාම යාම සඳහා පත්‍රිකා භාර දී නොමැති නිලධාරින් 2021/2022 වර්ෂයේ ස්ථානමාරු සඳහා ඉල්ලුම් කල යුතුය.

06. යම් කිසි විනය කටයුත්තක් සම්බන්ධව මූලික විමර්ෂණයක් ආරම්භ කර ඉදිරිපත් කරන ලද <u>**අතුරු වාර්තාව**</u> අනුව, යම් නිළධාරියෙකුට ස්ථාන මාරුවීමක් ලබා දි ඇති අවස්ථාවකදී, අදාල කාර්යාලයේ සේවය කල යුතු උපරිම කාලය ගණනය කිරීමේදී, පෙර කාර්යාලයේ සේවා කාලයද ගණනය කර එම සීමාව අවසන් වූ වීට ස්ථාන මාරුවක් සඳහා ඉල්ලුම් කිරිමට හැකියාව ඇත. (විනය හේතුවට අදාල වූ කාර්යාලය ඉල්ලුම් කිරිමට හැකියාවක් නොමැත).

එසේ වුවද <u>**විනය නියෝගයක්**</u> පැනවීම මගින් නියම කරන ලද කාර්යාලයක නිළධාරීයෙකුට වර්ෂ 05 ක සේවා කාලයක් සම්පූර්ණ වන තෙක් නැවත මාරුවීම් සඳහා ඉල්ලුම් කිරිමට හැකියාවක් නොමැත.(විනය නියෝගයක් මත නැවත සේවයේ පිහිටුවීම යන්න මීට අදාල නොවේ)

07. අධීක්ෂණ කළමනාකරණ සහකාර - තාක්ෂණික නොවන / තාක්ෂණික නිළධර ගණයේ තැපැල් සේවා නිලධාරි 1 ශ්‍රේණියේ නිළධාරි පුරප්පාඩු <u>**"අ" උප ලේඛණයේද,**</u>

අධීක්ෂණ කළමනාකරණ සහකාර - තාක්ෂණික නොවන / තාක්ෂණික නිළධර ගණයේ තැපැල් සේවා නිලධාරි 11 /111 ශ්‍රේණියේ නිළධාරි පුරප්පාඩු <u>**"ආ" උප ලේඛණයේද,**</u> ප්‍රසිද්ධ කර ඇත.

<u>**චක්‍ර ලේඛයේ දැක්වෙන එකී උපලේඛන, අයදුම්පත් ඉල්ලුම් කරන මෘදුකාංගයේ පහතට වැටෙන මෙනු (Dropdown Menu) ලෙස ඇතුලත් කර ඇත. අයදුම්පතෙහි එම මෙනුවෙන් අදාල කාර්යාල තෝරා සටහන් කළ හැක ( සාමාන්‍ය උපදෙස්හි 08 අනුව).**</u>

08. <u>අධීක්ෂණ කළමනාකරණ සහකාර - තාක්ෂණික නොවන / තාක්ෂණික නිළධර ගණයේ තැපැල් සේවා නිලධාරි 1 ශ්‍රේණිය</u>

<u>1 පෙළ තනතුර</u>

1. කාර්යභාර තැපැල් ස්ථානාධිපති (I පෙල)
2. අධීක්ෂණ නිලධාරි
3. මාණ්ඩලික සහකාර
4. ප්‍රධාන ලිපිකරු
5. සහකාර තැපැල් ප්‍රවාහන පරීක්ෂක

**අධීක්ෂණ කළමනාකරණ සහකාර - තාක්ෂණික නොවන / තාක්ෂණික නිළධර ගණයේ තැපැල් සේවා නිලධාරී 11 /111 ශ්‍රේණිය**

**11 පෙළ තනතුරු**

1. කාර්යභාර තැපැල් ස්ථානාධිපති (11 පෙල)
2. සහකාර තැපැල් ස්ථානාධිපති (සහායක)
3. සහන තැපැල් ස්ථානාධිපති
4. සැපයුම් නිලධාරී හා මිලදී ගැනීම් නිළධාරී (යාන්ත්‍රික ඉංජිනේරු කාර්යාලය)
5. තැපැල් බෙදීම් ප්‍රතිශෝධන නිළධාරී

**විශේෂ තේරීම් කිරීම් අයත් වූ තනතුරු ඇති කාර්යාල**

1. ජාත්‍යන්තර අධිවේගී (EMS) කාර්යාලය - (ම.තැ.හු)
2. කටුනායක ජාත්‍යන්තර ගුවන් තොටුපළ තැපැල් කාර්යාලය
3. මිලදී ගැනීම් හා සැපයුම් නිළධාරී - අධිකාරී (සැපයුම්) කාර්යාලය , නාරාහේන්පිට
4. මුද්දර කාර්යංශය - තැපැල් මූලස්ථානය / කටුනායක ගුවන්තොටුපල පිටවීම් පර්යන්තය
5. තොරතුරු තාක්ෂණ අංශය - තැපැල් මූලස්ථානය

**09.** ජාත්‍යන්තර අධිවේගි (EMS) කාර්යාලය (ම.තැ.හු) හා මැණික් හා ස්වර්ණාභරණ තැපැල් කාර්යාලයේ සේවා කාලය **එක් වසරක්** වන අතර, නිරීක්ෂණ පදනම යටතේ හා ඉදිරි සංශෝධන වලට යටත්ව කටුනායක ජාත්‍යන්තර ගුවන් තොටුපළ තැපැල් කාර්යාලයේ සේවා කාලය **වසර දෙකකි**.

**10.** ජාත්‍යන්තර අධිවේගී (EMS) කාර්යාලය (ම.තැ.හු) හා කටුනායක ජාත්‍යන්තර ගුවන් තොටුපළ තැ.කා සඳහා ඉල්ලුම් කරනු ලබන 1 පෙල, II හා III පෙල නිළධාරීන් එම කාර්යාල වලින් පිටත කාර්යාලයක වසර 05 ක සේවා කාලයක් සම්පූර්ණ කර තිබිය යුතු අතර වංචා, දූෂණ හා මූල්‍ය අක්‍රමිකතාවයන් වැනි ක්‍රියාවන්ට ලක් වී හෝ මූලික විමර්ශනයක් ආරම්භ කර හෝ විනය ක්‍රියාමාර්ග ගෙන ඇති නිලධාරීන් නොවිය යුතුය.

**11.** තැපැල් ප්‍රවාහන පරීක්ෂක කාර්යාලයේ (සහකාර තැපැල් ප්‍රවාහන පරීක්ෂක 1 පෙළ ) තනතුරු සඳහා මෝටර් කාර්මික විද්‍යාව සම්බන්ධ දැනුම සහ මෝටර් රථ පැදවීමේ බලපත්‍රයක් තිබිය යුතුය.

**12.** යාන්ත්‍රික ඉංජිනේරු කාර්යාලයේ (11 පෙල) තනතුර සඳහා මෝටර් කාර්මික විද්‍යාව සම්බන්ධ දැනුම තිබිය යුතුය.

**13.** තැපැල් මූලස්ථාන ගොඩනැගිල්ල තුළ පිහිටා තිබෙන සියළුම අංශ එකම කාර්යාලයක් සේ සලකා ඉල්ලුම්පත් කැඳවීමට කටයුතු කරනු ලැබේ. (මුද්දර කාර්යංශය සහ තොරතුරු තාක්ෂණ අංශය හැර)

**14.** ජාත්‍යන්තර අධිවේගී (EMS) කාර්යාලය සහ මධ්‍ය තැපැල් හුවමාරුව යන කාර්යාලයන් එකම කාර්යාලයක් සේ සලකා ස්ථාන මාරු සම්බන්ධයෙන් සලකා බැලීමේදී පිටත කාර්යාලයක සිට ජාත්‍යන්තර අධිවේගී (EMS) කාර්යාලයට ස්ථාන මාරු ලබා පැමිණි නිලධාරියෙකු එක් අවුරුද්දක සේවා කාලයකින් පසුව ස්ථාන මාරු යටතේ මධ්‍ය තැපැල් හුවමාරු කාර්යාල අපේක්ෂා කරන්නේ නම් අධිවේගී (EMS) කාර්යාලය හා මධ්‍ය තැපැල් හුවමාරුව එකම සේවා ස්ථානයක් සේ සලකා එහි සමස්ථ සේවා කාලය වසර 04 ක් සේ ගණනය කර ඉතිරි වසර 03 ක කාලය පමණක් මධ්‍ය තැපැල් හුවමාරුව සඳහා අවස්ථාව ලබාදීම සිදු කරනු ලැබේ.

**15.** සියළුම කාර්යාල සඳහා ස්ථාන මාරුවීම් ලබා දීමේදී පෙර සේවා කාලය තුල පිටත කාර්යාලයක වැඩි සේවා කාලයක් ඇති නිලධාරීන් සඳහා ප්‍රමුඛතාවයක් ලබා දීම සිදු වේ.

**16.** ස්ථාන මාරු ඉල්ලුම් කිරිමේදි, මෙහෙයුම් කාර්යාලයක සේවය කරනු ලබන නිළධාරියෙක් පාලන කාර්යාලයක් හා පාලන කාර්යාලයක සේවය කරනු ලබන නිළධාරියෙක් මෙහෙයුම් කාර්යාලයක් ඉල්ලුම් කිරිමේදි ප්‍රමුඛත්වය දෙනු ලැබේ. එක් සංකීර්ණයක් තුල පිහිටා ඇති සියළුම පාලන කාර්යාලයන් එක් කාර්යාලයක් සේ සලකා කටයුතු කරනු ලැබේ.

**17.** අධීක්ෂණ කළමනාකරණ සහකාර - තාක්ෂණික නොවන / තාක්ෂණික නිළධර ගණයේ තැපැල් සේවා නිලධාරී 1 ශ්‍රේණියේ නිළධාරියෙකුට අවසාන ස්ථාන මාරු නියෝගය නිකුත් කල පසු **අනුප්‍රාප්තිකයා පැමිණෙන තෙක් නොසිට දින 07 ක් තුල** අදාල නිළධාරියා නිදහස් කිරිම අදාල විධායක මාණ්ඩලික නිලධාරියාගේ/කාර්යභාර නිලධාරියාගේ වගකිම වේ. එසේ නිදහස් නොකරන සියළුම වගකිව යුතු නිළධාරීන් සම්බන්ධ වාර්තාවක් නියෝජ්‍ය තැපැල්පති (මෙහෙයුම්) විසින් තැපැල්පති වෙත ඉදිරිපත් කල යුතු අතර එම වගකිව යුතු නිලධාරියා සම්බන්ධයෙන් විනයානුකූලව කටයුතු කරනු ලැබේ.

**18.** අධීක්ෂණ කළමනාකරණ සහකාර - තාක්ෂණික නොවන / තාක්ෂණ නිළධර ගණයේ තැපැල් සේවා නිලධාරි, II හා III පෙල ශ්‍රේණියේ නිළධාරියෙකුට අවසාන ස්ථාන මාරු නියෝගය නිකුත් කල පසු **දින 07 ක් තුල** අදාල නිළධාරියා නිදහස් කිරිම මෙහෙයුම් හා පාලන කාර්යාලවල කාර්යභාර නිළධාරියාගේ වගකිම වේ. එහෙත් දැනට 11 පෙල නිළධාරි ඌණතාවයක් පවතින බැවින් , වැඩිම කාලයක් සේවය කරන ලද නිළධාරියාට ප්‍රමුඛතාවය ලබා දි ස්ථාන මාරු නියෝග ක්‍රියාත්මක කල යුතුය. එසේ නිදහස් නොකරන වගකිව යුතු සියළුම නිළධාරින් සම්බන්ධව වාර්තාවක් අදාල නියෝජ්‍ය තැපැල්පති විසින් නියෝජ්‍ය තැපැල්පති (මෙහෙයුම්) වෙත ඉදිරිපත් කල යුතු අතර එම වගකිව යුතු නිලධාරින් සම්බන්ධව විනයානුකූලව කටයුතු කරනු ලැබේ.

19. 11 පෙල නිළධාරි පුරප්පාඩු පුරවන තෙක් කොළඹ කලාපය තුල පිහිටි සියළුම මෙහෙයුම් තැපැල් කාර්යාල ඇතුළුව ගල්කිස්ස, දෙහිවල , මොරටුව , බත්තරමුල්ල යන කාර්යාල වලට ඉල්ලුම් කරන නිලධාරින්ට (11/111 ශ්‍රේණි) වසර 01 ක සේවා කාලයකින් පසුව නැවත ස්ථාන මාරුවීම් සඳහා ඉල්ලුම් කිරිමට හැකියාව ඇත.

හසලක, ලග්ගල පල්ලේගම, විල්ගමුව, වන්නිරස්නායකපුර, ඩෙල්ෆ්, ඇතිමලේවැව, කන්දකැටිය, දඹගල්ල, සූරියවැව, මිද්දෙනිය, කටුවන යන කාර්යාලවලට ඉල්ලුම් කරන නිලධාරින්ට වසරක (01) සේවා කාලයෙන් පසුව නැවත ස්ථාන මාරුකිරීම් සඳහා ඉල්ලුම් කිරීමට හැකියාව ඇත. මෙම නිලධාරින් සඳහා 2022/2023 ස්ථානමාරු ලබාදීමේදී ඔවුන් ඉල්ලීම් කරනු ලබන කාර්යාල වෙත ප්‍රමුඛතාවය ලබාදෙනු ලැබේ.

20. උතුරු පළාතේ ස්ථිර පදිංචිය නොමැති, රාජකාරි සඳහා ස්ථාන මාරුවීම් ලබන වෙනත් පළාත් වල නිළධාරින් සඳහා උතුරු පළාත දූෂ්කර (ඉතා අහිතකර) සේ සලකා එක් අවුරුද්දකට පමණක් සීමා කරනු ලබන අතර, උතුරු පළාතේ ස්ථිර පදිංචිය ඇති, රාජකාරි සඳහා ස්ථාන මාරුවීම් ලබා වෙනත් පළාත් වල සේවය කරන නිළධාරින්ට එම පළාත් දූෂ්කර (ඉතා අහිතකර) සේ සලකා එක් අවුරුද්දකට පමණක් සීමා කරනු ලැබේ. ඔවුනට එළඹෙන ස්ථාන මාරු කිරිම් වලදි ඉල්ලුම් කිරිමට හැකියාව ඇත.

21. සාමාන්‍යයෙන් එක් කාර්යාලයක සේවය කිරීමට නියමිත උපරිම කාලය සම්පූර්ණ කරන ලද නිළධාරීහු, මාරුවීම් ඉල්ලිමට සුදුසුකම් ලබති. කිසියම් කාර්යාලයක් සඳහා අයදුම්කරුවන් නොමැති අවස්ථා වලදී මෙසේ නියමිත කාලය සම්පූර්ණ නොකල නිළධාරින් වුවද, එම කාර්යාල වලට මාරු කිරිම් සඳහා සලකා බලනු ලැබේ.

22. නිල නිවාස පදනම මත ස්ථානමාරු ලබා ගැනීමේදී අදාල නිල නිවාසයේ පදිංචි වීමේ වගකිම අදාල නිලධාරියා සතුවේ.

**ස්ථාන මාරු කිරිම් සම්බන්ධව අවසන් තිරණ ගැනිමේ බලය තැපැල්පති සතුවේ.**

## සාමාන්‍ය උපදෙස්

01. ස්ථාන මාරු කිරිම වලට සුදුසුකම් ලබා ඇති **සියළුම නිලධාරින්** මෙ සමග යොමු කර ඇති **පී.ඕ.එන් 47** ආකෘති පත්‍රයෙන් එක් අයදුම්පතක් පමණක් ඉදිරිපත් කිරිම ප්‍රමාණවත් වේ. තමා අයදුම් කරන කාර්යාල හා තනතුරු (උපරීම හයක්) තමාගේ මනාපය පරිදි අනුපිළිවෙලින් අයදුම් කර තිබිය යුතුය. (අයදුම්පතින් විමසා ඇති සියළුම කරුණු නිවැරදිව සම්පූර්ණ කල යුතුය).

මාරු කිරිම ක්‍රියාවලියට අනුව කාර්යභාර තැපැල් ස්ථානාධිපති තනතුර සඳහා තෝරා ගැනිමේදී පොදු කාර්යභාර විභාගය සමත් නිළධාරින්ට ප්‍රමුඛතාවය ලබා දෙන අතර, කාර්යභාර විභාගය සමත් නොවූ නිලධාරීන්, එම තනතුර සඳහා තේරීමේදී පළමු පෙල වසර 02 ක් අධීක්ෂණ නිලධාරින් ලෙස සේවය කර තිබිය යුතුය. ( **ඉහත සුදුසුකම් සපුරා ඇති ඉල්ලුම්කරුවන් නොමැති අවස්ථා වලදී මෙම නියමය නොසලකා කටයුතු කිරීමේ හැකියාව පවති.**)

02. **2020 / 2021 වාර්ෂික ස්ථාන මාරුකිරිම් යටතේ මාරුවීම් ලැබී ඇතත්, මෙම චක්‍රලේඛය නිකුත් වූ දිනය වන තෙක් මෙතෙක් ක්‍රියාත්මක නොවූ සියළු ස්ථාන මාරු මෙයින් අවලංගු වන අතර, එසේ ස්ථාන මාරු ලැබුනද ක්‍රියාත්මක නොවූ , අදාල කාර්යාලයේ නියමිත සේවා කාලය සම්පූර්ණ වූ නිළධාරීන්ද නැවත මාරුකිරිම් සඳහා අයදුම් කළ යුතුය.**

03. **තම සේවා ස්ථානයේ උපරිම කාල පරිච්ඡේදය සම්පූර්ණ කර ඇති, එහෙත් නියමිත දිනට ස්ථාන මාරුවීම් අයදුම්පතක් ඉදිරිපත් කර නොමැති සියළුම නිළධාරීන්, මාරු මණ්ඩලයේ තේරීම් අවසන් වූ පසු පුරප්පාඩු ඉතිරිව පවත්නා කුමන හෝ කාර්යාලයකට මාරු කරනු ලැබේ. ඒ සම්බන්ධව පසුව ඉදිරිපත් කරන අභියාචනා සලකා බලනු නොලැබේ.**

04. දැනට සේවය කරන කාර්යාලයේ උපරිම සේවා කාලය සම්පූර්ණ කර ඇති අධීක්ෂණ කළමනාකරණ සහකාර තාක්ෂණික නොවන / තාක්ෂණික නිළධර ගණයේ තැපැල් සේවා නිලධාරි 1ශ්‍රේණිය නීළධාරින් එහිම සේවා දීර්ඝ කිරිමක් ඉල්ලුම් කරන්නේ නම්, එම ඉල්ලිම සලකා බලනුයේ අදාල මාණ්ඩලික නිලධාරීන් සහ අදාල නියෝජ්‍ය තැපැල්පති නිර්දේශ කර තිබේ නම් පමණි. නිර්දේශ නොකරන්නේ නම් සනාථ කල හැකි හේතු ඉදිරිපත් කර තිබිය යුතුය.

05. දැනට සේවය කරන කාර්යාලයේ උපරිම සේවා කාලය සම්පූර්ණ කර ඇති අධීක්ෂණ කළමනාකරණ සහකාර තාක්ෂණික නොවන / තාක්ෂණික නිළධර ගණයේ තැපැල් සේවා නිලධාරි 11 /111 ශ්‍රේණියේ නිළධාරින් සම්බන්ධයෙන් සේවා දීර්ඝ කිරිම් සලකා බලනුයේ කාර්යාලය/ අංශ භාර ප්‍රධානියා සහ අදාල මාණ්ඩලික නිලධාරින් විසින් නිර්දේශ කර තිබෙ නම් පමණි. නිර්දේශ නොකරන්නේ නම් සනාථ කල හැකි හේතු ඉදිරිපත් කර තිබිය යුතුය.

06. පළමු ශ්‍රේණියේ පුරප්පාඩු ප්‍රසිද්ධ කිරීමෙන් අනතුරුව වාර්ෂික ස්ථානමාරුවීම් සිදු කර පසුලේඛන ගත ස්ථානමාරුද ලබාදීමෙන් අනතුරුව තවදුරටත් පළමු පෙළ පුරප්පාඩු පවතින්නේ නම් පොරොන්තු ලේඛනයේ උසස්වීම් ලැබීමට නියමිත නිලධාරීන්ට පළමු පෙළ උසස්වීම් සහිත ස්ථානමාරුවීම් ලබා දීම සිදු කරනු ලැබේ.

**07.** **ස්ථාන මාරු තීරණ වෙබ් පෝටලයේ පල කරනු ලැබීමෙන් පසු <u>දින 10 ක්</u> ඇතුළත අභියාචනා ලිඛිතව ඉදිරිපත් කල යුතුය.**

අධීක්ෂණ කළමනාකරණ සහකාර - තාක්ෂණික නොවන / තාක්ෂණික නිළධර ගණයේ තැපැල් සේවා නිලධාරි 1ශ්‍රේණියේ නිලධාරියෙකු **තැපැල්පති, සභාපති- පළමු පෙල අභියාචනා මණ්ඩලය, තැපැල් මූලස්ථානය , කොළඹ 10** යන ලිපිනයට සෘජුවම ඉදිරිපත් කළ යුතු අතර, අදාල ලිපි කවරයේ වම් පස ඉහල කෙලවරේ **<u>පළමු පෙල අභියාචනා - 2021/2022</u>** යන්න සඳහන් කල යුතුය.

අධීක්ෂණ කළමනාකරණ සහකාර - තාක්ෂණික නොවන / තාක්ෂණ නිළධර ගණයේ තැපැල් සේවා නිලධාරි 11/ 111 ශ්රේණියේ නිලධාරියෙකු **නියෝජ්‍ය තැපැල්පති (මෙහෙයුම්), සභාපති- දෙවන පෙල අභියාචනා මණ්ඩලය, තැපැල් මූලස්ථානය , කොළඹ 10** යන ලිපිනයට සෘජුවම ඉදිරිපත් කළ යුතු අතර, අදාල ලිපි කවරයේ වම්පස ඉහල කෙලවරේ **<u>දෙවන පෙල අභියාචනා - 2021/2022</u>** යන්න සඳහන් කල යුතුය.

**08.** අභියාචනා බාර ගැනීමේදී , අභියාචනාව භාර දුන් දිනය සැලකිල්ලට ගනු ලැබේ. **<u>අවසාන මාරු නියෝගය නිකුත් කල පසුව එවනු ලබන කිසිදු අභියාචනාවක් සලකා බලනු නොලැබේ.</u>** (මාරුකිරිම් සම්බන්ධව තේරීම් කරන ලද ස්ථාන දැක්වෙන පූර්ව දැන්වීම් දෙපාර්තමේන්තු සේවා පෝටලයේ පල කරනු ලැබේ.

දිවයින පුරා කාර්යාල වල 11 හා111 පෙළ අධික පුරප්පාඩු සංඛ්‍යාවක් පවතින බැවින් ස්ථාන මාරු සිදු කිරිමේදී සියළුම පුරප්පාඩු පිරවීම සිදු නොකරන අතර අනුමත කාර්ය මණ්ඩල පුරප්පාඩු සංඛ්‍යාවෙන් 2/3 පදනම මත පුරප්පාඩු පිරවීම සිදු කරනු ලැබේ.

**09.** **<u>අයදුම්පත් ඉදිරිපත් කලයුතු ආකාරය</u>**

මෙම චක්‍රලේඛය සමග යා කර ඇති ඉල්ලුම්පත්‍ර සම්පූර්ණ කර **<u>2022 මැයි මස 02</u>** දින හෝ එයට පෙර ලැබෙන සේ **ලේකම්, මාරු කිරිම් මණ්ඩලය, තැපැල් මූලස්ථානය , 310, ඩී.ආර්.විජේවර්ධන මාවත, කොළඹ 10.** යන ලිපිනයට ලියාපදිංචි තැපැලෙන් එවිය යුතුය. අයදුම්පත් සමග ඒවා ඉදිරිපත් කර ඇති නිළධාරීන්ගේ නාම ලේඛණයක්ද කාර්යභාර නිළධාරියා විසින් අමුණා එවිය යුතුය. **<u>ප්‍රමාද වී ලැබෙන අයදුම්පත් බාර ගනු නොලැබේ</u>**

**10.** **සේවය කරන කාර්යාලයේ අවු 04 සම්පූර්ණ නොකල එහෙත් පහත කරුණු පදනම් කරගෙන වාර්ෂික ස්ථාන මාරු සඳහා ඉල්ලුම් කල හැකිය.**

- **කාර්යාල වර්ගීකරණය මත (ඉතා අහිතකර,අහිතකර,හිතකර)**
- **රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 02/2022 අනුව විශ්‍රාම යාමේ වයස අවුරුදු 65 දක්වා දීර්ඝ කර ඇති බැවින් පෙර වර්ෂයේ වයස් පදනම මත ස්ථානමාරු ලද එහෙත් විශ්‍රාම ගොස් නොමැති නිලධාරීන් මෙම වර්ෂයේ ස්ථානමාරු සඳහා ඉල්ලුම් කල යුතුය.**
- **උතුරු පළාතේ ස්ථිර පදිංචිය නොමැති නිලධාරීන් හා උතුරු පළාතේ ස්ථිර පදිංචිය ඇති, රාජකාරි සඳහා ස්ථාන මාරුවීම් ලබා වෙනත් පළාත් වල සේවය කරන නිළධාරීන්**
- **තමා පදිංචි ප්‍රදේශයෙන් පිට එහෙත් නිල නිවාසයක් නොමැති කාර්යාලයක සේවය කරන නිලධාරීන්**
- **2020/2021 වර්ෂයේ පසුලේඛනගත වූ හා මාරුමණ්ඩලයේ අභිමතය පරිදි ස්ථාන මාරු ලද 11/111 පෙළ නිලධාරීන්**

**මාරුකිරිම් මණ්ඩලය - 0114927252 / 0112328301 - දිගුව 1900 .**

2022.04.21

රංජිත් ආරියරත්න
තැපැල්පති

රංජිත් ආරියරත්න
තැපැල්පති

* සටහන -

**අයදුම්පත් ඉදිරිපත් කරන අවසාන දිනය දක්වා වරින් වර ඔබගේ පහසුව පිණිස යාවත්කාලීන තොරතුරු ඇතුලත් චක්‍ර ලේඛ අවස්ථානුකූලව වෙබ් පෝටලයේ පල කරන බැවින් අවසන් දිනය දක්වා උපදෙස් අපේක්ෂාවෙන් වෙබ් පෝටලය නිරීක්ෂණය කල යුතුය.**